සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

8 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 14 S

# කතෝලික ධර්මය

නම ...............................................

කාලය පැය දෙකයි

උපදෙස් : සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,

* අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරන්නේ,
i. සමාරියෙනි. ii. ගලීලයෙනි. iii. ජුදයෙනි. iv. පලස්තීනයෙනි.

02. ලූක් සුබාරංචිය පිළිගන්වනු ලැබුවේ
i. තියෝපිලස්ට ය. ii. ගමාලියෙල්ට ය. iii. නාතාන්ට ය. iv. සිමියොන්ට ය.

03. "මරියාණෙනි බිය නොවන්න ඔබ ............ වරප්‍රසාද ලද්දේහිය. ලූක් 1: 30 ට අනුව හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
i. ශුද්ධාත්මයාණන්ගෙන් ii. පියාණන් වහන්සේගෙන්
iii. දෙවියන් වහන්සේගෙන් iv. පුත්‍රයාණන් වහන්සේගෙන්

04. සෙකරියස් තුමාගේ යාගයෙන් ආරම්භ වන සුබාරංචි ග්‍රන්ථයේ සංකේතය වන්නේ,
i. ගවයා ය. ii. රාජාලියා ය. iii. මිනිසා ය. iv. සිංහයා ය.

05. මාගේ අසල්වැසියා කවරෙක්ද යන්න විනයධරයන් නැගූ ප්‍රශ්නයට ජේසුස් වහන්සේ පිළිතුරු දුන්නේ,
i. මුහුන් පිළිබඳ උපමාවෙනි. ii. අකීකරු පුත්‍රයාගේ උපමාවෙනි,
iii. දැල පිළිබඳ උපමාවෙනි. iv. යහපත් සමරිතානුවරයාගේ උපමාවෙනි.

06. දාවිත් රජතුමාගෙන් ලෝක ගැලවුම්කරුවාණන් පැමිණෙන බව දාවිත් රජතුමාට දන්වනු ලැබුවේ.
i. නාතාන් දිවැසිවරයා ය ii. එලියා දිවැසිවරයා ය iii. යෙසායා දිවැසිවරයා ය iv. ආමොස් දිවැසිවරයා ය

07. එම්මානුවෙල් යන්නෙහි අර්ථය වන්නේ,
i. දෙවියන් වහන්සේගේ මිත්‍රයාය. ii. දෙවියන් වහන්සේ අප සමඟය.
iii. දෙවියන් වහන්සේ ගලවන සේක. iv. දෙවියන් වහන්සේ උසස් කළ සේක.

08. "නියමිත පමණට වැඩියෙන් අයබදු නොගන්න" යනුවෙන් ස්නාවක ජොහාන් තුමා අනුශාසනා කරනුයේ,
i. අයකැමියන්ට ය. ii. ප්‍රභුවරුන්ට ය. iii. හමුදා නිළධාරීන්ට ය. iv. සාමාන්‍ය ජනතාවට ය.

09. ලූක් සුබාරංචියයේ දෙවන වෙලුම ලෙස සලකනු ලබන්නේ,
i. ජොහාන් සුබාරංචියයි. ii. මාක් සුබාරංචියයි. iii. ආපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතයි iv. මතෙව් සුබාරංචියයි

10. ස්නාවක ජොහාන්තුමා ජනතා මෙහෙවර ආරම්භ කරනු ලැබුවේ
i. ගලීලයෙනි ii. සීනායි කන්දෙනි iii. ක්‍රිද්‍රෝන් විල අසලෙනි iv. ජෝර්දාන් තොටුපොළෙනි.

* අංක 11-15 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

11. ලූක් සුබාරංචියේ ජේසුස් වහන්සේගේ වංශාවලිය ........................................ ආරම්භ කරනු ලබයි.

12. මෝසෙස් තුමාගේ නීතියට අනුව සෑම ජුදා ........................................ දේව මාලිගයේ කැප කළ යුතුය.

13. ජේසුස් වහන්සේගේ උපත පළමුවෙන් ම ...................................... ප්‍රකාශ කළේය.

14. පාලුකරයේ මොරගසන හඬ ස්නාවක ජොහාන් තුමා බව ............................................. සඳහන් කරයි.

15. ජුදා සමාජය අයකැමියන් ........................................... ලෙස සලකා කොන් කළහ.

(එඬේරුන්ට, ආදම්ගෙන්, යෙසායා දිවැසිවරයා, පව්කරුවන්, කුළුඳුල් පිරිමි දරුවෙක් ම,
ජෙරමියා දිවැසිවරයා, ශාස්ත්‍රවන්තයන්ට)

✹ අංක 16-20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් "✓" ලකුණ ද, වැරදි නම් "✕" ලකුණ ද යොදන්න.

16. සෙකරියස්තුමා ජුදා ආගමේ පූජකයෙකි. (.............)

17. ජේසුස් වහන්සේ මහ සිකුරාදා දින කොටළුවෙකු පිට නැගී ජෙරුසලමට පිවිසි සේක (.............)

18. ස්නාවක ජොහාන්තුමාගේ දේව කාර්යය වූයේ ජේසුස් වහන්සේගේ පෙර මග සූදානම් කිරීමය (.............)

19. මතෙව්තුමා ජේසුස් වහන්සේගේ වංශාවලිය ආබ්‍රහම්තුමා ගෙන් ආරම්භ කරනු ලබයි. (.............)

20. ලුක් සුබාරංචිය ක්‍රි.ව. 80-90 කාලයේදි සම්පාදනය වී ඇත. (.............)

(ල: 2 x 20 = 40)

## II - පත්‍රය

❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. i. ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳව සඳහන් කරන සුවිශේෂක කතුවරුන් දෙදෙනා නම් කරන්න.
ii. ස්නාවක ජොහාන්තුමා ආහාරයට ගනු ලැබුවේ මොනවාද?
iii. ලුක් සුබාරංචිය හා ක්‍රියාපොත ලුක්තුමාගේ ම බව තහවුරු කරනු ලබන කරුණු 2 ලියන්න.
iv. ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ ඉදිරිපත් කරනු ලබන සිදුවීම් 2 ක් ලියන්න.
v. පහත ගීතිකා පදය සම්පූර්ණ කරන්න.
මරියතුමීගේ පෙම්බර මුහුණේ එළියක් දිස්වූයේ
.................................................................................
vi. ස්නාවක ජොහාන්තුමාගේ දෙමාපියන් නම් කරන්න.
vii. ලුක් සුබාරංචියේ සඳහන් කාන්තා චරිත 2 ක් නම් කරන්න.
viii. ජේසුස් වහන්සේගේ කාලයේ පලස්තීනය බෙදුණු ප්‍රධාන කොටස් 2 ක් ලියන්න.
ix. දේව සැලැස්මට අනුගාමී වීමට ඔබට කළ හැකි දේවල් 2 ක් ලියන්න.
x. ස්නාවක ජොහාන්තුමාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 2 ක් ලියන්න.

(ලකුණු 2 x 10= 20)

02. i. ලුක් සුබාරංචියේ පරමාර්ථය ලියන්න.
ii. පාවුලුතුමා රෝමයේ සිරගතව සිටින විට ලුක්තුමා ද එහි වු බව සනාථ කෙරෙන ශුද්ධ ලියවිලි පාඨ 3 ලියන්න.
iii. අපගේ හැකියා දක්ෂතා දෙවියන් වහන්සේ වෙනුවෙන් යෙදවිය හැකි අවස්ථා 5 ක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

03. i. දේව පණිවිඩය අවිශ්වාස කළ සෙකරියස් තුමාට හිමි වු විපාකය කුමක්ද?
ii. ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ ජුසේතුමාට සිහිනයකින් දැනුම් දුන් කරුණු 3 ක් ලියන්න.
iii. දෙවියන් වහන්සේ අපට කතා කරන මාර්ග 5 ක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

04. i. ශුද්ධාත්මයාණන්ගේ සුබාරංචිය ලෙස ලුක් සුබාරංචිය හැඳින්වීමේ හේතුව කුමක්ද?
ii. ලුක් සුබාරංචිය හඳුන්වනු ලබන වෙනත් නම් 3 ක් ලියන්න.
iii. කොන්වූවන්ට ජේසුස් වහන්සේ අනුකම්පා කරන බව දැක්වීමට ඉදිරිපත් කළ සකේවුස් පිළිබඳ සිද්ධිය කෙටියෙන් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

05. i. සමාජය තුළ ඉහළ මට්ටමේ වැජඹුන ප්‍රභුවරුන්ට ස්නාවක ජොහාන් තුමා අමතන්නේ කුමන නමකින්ද?
ii. ස්නාවක ජොහාන්තුමා අනුශාසනා කළ සමාජ කණ්ඩායම් තුන නම් කර ඔවුන්ට ලබා දුන් අනුශාසනා වෙන වෙන ම ලියන්න.
iii. ස්නාවක ජොහාන් තුමාගේ අනුශාසනා තුලින් ඔබට ලැබෙන මඟපෙන්වීම් 5 ක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

06. i. මරියතුමිය හා ජුසේතුමා ජේසුතුමාව කැප කිරීම සඳහා රැගෙන යන්නේ කොහේටද?
ii. ලුක් සුබාරංචිය යාච්ඤාවේ සුබාරංචිය ලෙස ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු 3 ක් ලියන්න.
iii. යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීමට අවශ්‍යය ශක්තිය පතා කෙටි යැදුමක් නිර්මාණය කරන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

**පළමු වාර පරීක්ෂණය - 2019**
**කතෝලික ධර්මය**

8 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය
# I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 1.ii | 6. i | 11. ආදම්ගෙන් | 16. | (✓) |
| 2. i | 7.ii | 12. කුලුදුල් පිරිමි දරුවෙක්ම | 17. | (✗) |
| 3.iii | 8. i | 13. එඩේරුන්ට | 18. | (✓) |
| 4. i | 9.iii | 14. යෙසායා දිවැසිවරයා | 19. | (✓) |
| 5.iv | 10. iv | 15. පව්කරුවන් | 20. | (✗) |

(ල. 2 x 20 = 40)

**පිළිතුරු පත්‍රය II කොටස**

01.i. ශු. මතෙව් තුමා

ශු. ලූක් තුමා

ii. පළගැටියන් හා වන මී iii. භාෂාව හා ශෛලිය

iv. - ජේසුස් වහන්සේගේ උපත

- ජේසුස් වහන්සේ දේව මාලිගාවේ දී කැප කරනු ලැබීම
- ජේසුස් වහන්සේගේ ළමා විය
- වයස අවුරුදු 12 දී දෙමාපියන්ගෙන් මඟහැරී නැවත දේව මාලිගාවේදී සොයා ගනු ලැබීම

v. ජුසේ තුමා කිසිදාකත් නෑ දෙව් අණකට පිටුපෑවේ

vi. පියා - සෙකරියස් තුමා

මව - එළිසබෙත් තුමිය

vii. - මරිය තුමිය

- එලිසබෙත් තුමිය
- අන්නා දිවැසිවරිය
- පව්කාර ස්ත්‍රිය (කතෝලික ධර්මය පොත පිටු අංක : 09)

viii. - ගලීලය

- සමාරිය
- ජුදය

ix. - දේව හඬට සවන් දී කටයුතු කිරීම

- දේව වචනයට අනුකූලව දිවි ගත කිරීම ආදී පිලිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

x. - සත්‍යවාදී බව

- දේව හඬට කීකරු බව ආදී පිළිතුරු සඳහා ලකුනු ලබා දෙන්න. (ල. 2 x 10=20)

02. i. ජේසුස් වහන්සේ ජුදා ජනතාවගේ පමණක් නොව මුළු මිනිස් සංහතියේම ගැලවුම්කරුවාණන් බව පෙන්වා දීම.

(ල : 02)

ii. ලූක් පමණක් මා සමඟ සිටී මාත් ඔබ සමඟ කැඳවාගෙන එන්න. මාගේ වැඩට ඔහු ප්‍රයෝජනවත් සහකාරයෙකි"

(2 තිමෝති 4:11)

- "මාගේ හවුල් සේවකයන් වන මාක් ද .... ලූක් ද ඔබට ආචාර කරති. (පිලමොන් 1:24)
- "අපේ හිතවත් ලූක් නම් වෛද්‍යවරයා ද.... ඔබට ආචාර කරති. (කොලොස්සි 4:14) (ල:03)

iii. - දේවස්ථානයේ ගායනා කණ්ඩායමට සහභාගී වීම.

- පාසලේ මිතුරු මිතුරියන් හට අධ්‍යාපන කටයුතු සඳහා සහය වීම.
- තමන් ඉතු දේ අන් අය සමඟ බෙදා හදා ගැනීම
- දෙවියන් වහන්සේගේ මහිමය ගැන කියවෙන ගීතිකා, ලිපි ආදිය නිර්මාණය කිරීම
- දේව වචනය අන් අය සමඟ බෙදා ගැනීම ..... ආදි පිළිතුරු සදහා ලකුණු ලබා දෙන්න. (ල:05)

03.i. - ස්නාවක ජොහාන්තුමාගේ උපත දක්වා ගොළු භාවයට පත් වීම. (ල:02)

ii. - ඔබේ බිරිඳ වන මරියා පාවා ගන්නට බිය නොවන්න.

- මන්ද, ඈ ගැබ්ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන් අනුහසිනි
- ඈ පුතෙකු බිහිකරන්නීය. උන්වහන්සේට ජේසුස් යන නාමය තැබිය යුතුය.
- මන්ද සිය සෙනඟ ඔවුන්ගේ පාපවලින් මුදාලන්නේ එතුමාණෝය. (ල:03)

iii. - කාලයේ සලකුණු තුළින්
දෙමව්පියන් මගින්
පැවිදි සොයුරු සොයුරියන් තුළින්
අසරණ ජනතාව තුළින්
ගුරුවරු තුළින්... ආදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

04. i. - ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය ගැන සඳහන් කරන බැවින් ශුද්ධාත්මයාණන්ගේ සුබාරංචිය ලෙස හැඳින්වේ. (ල:02)

ii. - යාච්ඥාවේ සුබාරංචිය
- අන්‍ය ජාතිකයන්ගේ සුබාරංචිය
- දයාවේ සුබාරංචිය
- ශුද්ධාත්මයාණන්ගේ සුබාරංචිය
- කාන්තාවන්ගේ සුබාරංචිය
- දිළින්දන්ගේ සුබාරංචිය
- කොන් වූවන්ගේ සුබාරංචිය (ල: 03)

iii. පිටු අංක 10 දැක්වෙන ආකාරයට සකෙවුස්ගේ සිද්ධිය ලියා තිබේ නම් ලකුණු ලබා දෙන්න. (ල: 05)

05. i. - එම්බා පොළොං වංශය (ල: 02)

ii. - ජනතාව - අඳන දෙකක් ඇති අය නැති අයට දෙන් වා : කෑම ඇති අය කෑම නැති අයට දෙන්වා
- අයකැමියන් - නියමිත පමණට වැඩියෙන් අය බදු නොගන්න.
- හමුදා නිළධාරීන්ට - කිසිවෙකුගෙන් බලහත්කාරයෙන්වත් බොරු චෝදනා නැගීමෙන්වත් කිසිවක් පැහැර නොගන්න. ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න. (ල:03)

iii. - වැටුපට සරිලන සේවයක් ලබා දීම
- අන් අය සමඟ බෙදාහදා ගැනීම
- ලද දෙයින් සතුටු වීම
- බොරු චෝදනා නැගීමෙන් වැළකී සිටීම
- අනුන් තලා පෙළ සේවය ලබා නොගැනීම ... ආදී පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල:05)

06. i. - ජෙරුසලම් දේවමාලිගාවට

ii. - ජේසුස් වහන්සේ බෞතිස්මා ලබා යාච්ඥා කරමින් සිටිය දී ශුද්ධාත්මයාණන් වහන්සේ උන්වහන්සේ මත පහළ වූ සේක.

- අපෝස්තුලුවරුන් තෝරා ගැනීමට පෙර ද උන්වහන්සේ මුළු රැයක්ම යාච්ඤාවෙන් ගත කළ සේක.

- ජේසුස් වහන්සේ යාච්ඤා කරනු දැක ශ්‍රාවකයන් ද ඔවුන්ට යාච්ඤා කරන ආකාරය උගන්වන ලෙස ඉල්ලීම. එවිට ජේසුස් වහන්සේ "ස්වර්ගයෙහි වැඩ සිටින" යාච්ඤාව ඉගැන්වීම. (ල: 03)

iii. ශිෂ්‍යයා ලියා ඇති යැදුම බලා ලකුණු ලබා දෙන්න. (ල: 05)